## කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

## නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය, දෙවන වසර – 2022

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය II

(පැය තුනයි)

මුළු ප්‍රශ්න ගණන: 06

<u>පළමු ප්‍රශ්නයද ඇතුළුව</u> ප්‍රශ්න <u>තුනකට</u> පිළිතුරු සපයන්න.

(අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.)

---

1. (අ) සහ (ආ) යන කොටස් දෙකටම පිළිතුරු සපයන්න.

(අ) මායා රාජ්‍යයේ නගර සභා පනත මගින් නගර සභාවලට 'ආපනශාලා, හෝටල්, කඩසාප්පු සහ වෙළඳපොලවල් හැර වෙනත් ස්ථානවල ආහාර පිළියෙළ කිරීම සහ විකිණීම පාලනය කිරීම, පරීක්ෂා කිරීම සහ නියාමනය කිරීමට ' හැකියාව ලැබේ. මායා රාජ්‍යයේ රත්මුතු නගර සභාව විසින් සම්පාදනය කරන ලද අනු නීතියක් මගින් දක්වනු ලබන්නේ 'ආහාර හසුරුවන පුද්ගලයින් මායා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍ය නිලධාරියෙකු විසින් සහතික කළ යුතු බවයි'. එවැනි පුද්ගලයන් පුද්ගලික සනීපාරක්ෂාව පිළිබඳ ඉහළ ප්‍රමිතීන් පවත්වා ගත යුතු අතර සෑම විටම ඔවුන්ගේ හිසකෙස් අඟලකට වඩා අඩුවෙන් කපා ගත යුතුය.

කාර්යාලයකට බත් පාර්සල් සපයන මලිති, මෙම අතුරු ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීමේ චෝදනාවට ලක්වී ඇත්තේ ඇයට අවශ්‍ය පරිදි වෛද්‍ය නිලධාරියෙකුගේ සහතිකයක් නොමැති වීම සහ ඉණ දක්වා ගෙතූ කොණ්ඩය නඩත්තු කිරීම හේතුවෙනි. මායා රාජ්‍යයේ නීතිය ශ්‍රී ලංකාවේ නීතියට සමාන යැයි උපකල්පනය කරන්න. මලිතිට ලබා ගත හැකි නීතිමය පිළියම් සම්බන්ධයෙන් උපදෙස් දෙන්න.

(ලකුණු 50)

(ආ) පළාත් පාලන ආයතනවල බලතල සහ කාර්යයන් ප්‍රාදේශීය පරිපාලනය (local administration) සවිබල ගැන්වීමට සහ ප්‍රාදේශීය ප්‍රජාතන්ත්‍රවාදය (local democracy) පොහොසත් කිරීමට සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරයි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ පවතින පළාත් පාලන ක්‍රමයේ ප්‍රධාන දුර්වලතාව වන්නේ පළාත් පාලන ආයතනවල කටයුතු සම්බන්ධයෙන් මධ්‍යම රජයට ඇති ආධිපත්‍යයයි.

පළාත් පාලන ආයතන ස්වයං පාලන ආයතනයක් බවට පත් කිරීම සහතික කිරීම සඳහා වන ප්‍රතිසංස්කරණ පැහැදිලි කරන්න. වෙනත් අධිකරණ බල ප්‍රදේශවලින් නිදසුන් දෙන්න.

(ලකුණු 50)

2. (අ) හෝ (ආ) කොටස්වලින් එකකට පිළිතුරු සපයන්න.

(අ) 'රාසෝ' යනු නිදහසින් පසු මරියානා රාජ්‍යය සඳහා ෆෙඩරල් ක්‍රමයක් ඉල්ලා සිටින ජාතික සුළුතර කණ්ඩායමකි. මරියානා රාජ්‍යය ජනරජයක් වුවද, බ්‍රිතාන්‍ය යුගයේ හඳුන්වා දුන් ස්වෛරීත්වය සහ ඒකීයත්වය පිළිබඳ සාම්ප්‍රදායික සංකල්ප දිගටම අනුගමනය කරයි. 1980 ගණන්වලදී රාසෝ ෆෙඩරල් ක්‍රමයක් සඳහා විවිධ යෝජනා ඉදිරිපත් කළේය. කෙසේ වෙතත්, සාම්ප්‍රදායික සංකල්පවලින් බැහැර වීමට මරියානා රජය දක්වන මැලිකම නිසා රාසෝ කණ්ඩායම කලකිරීමට පත් වූ අතර ඔවුන් ව බාහිර ස්වයං නිර්ණය ඉල්ලා සිටීමට පෙළඹීණි. 1995 සිට මරියානා රජය ව්‍යවස්ථා සංශෝධන හරහා කලාපීය ඒකකවලට බලතල බෙදා හැරීමට උත්සාහ කර ඇත.

ඔබ ලෝක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පර්යේෂණ පදනමෙහි (Global Constitutional Researchers Foundation) නීති උපදේශකයෙකු යැයි උපකල්පනය කරන්න. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනය හැර, පිළිවෙලින් 1948-1985 සහ 1994-2009 දක්වා ශ්‍රී ලංකාවේ බලය බෙදා හැරීමේ උත්සාහයන් දෙකක් තෝරාගෙන, බලය බෙදා හැරීමේ විවිධ ආකෘතීන් අර්ථකථනය කිරීමේ එකඟතාවයක් නොමැතිකම හේතුවෙන් බලය බෙදා හැරීම ව්‍යර්ථ විය හැක්කේ කෙසේද යන්න පිළිබඳව මරියානා රාජ්‍යයට නීතිමය මතයක් ලියා දක්වන්න.

(ලකුණු 100)

(ආ) දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ නඩු තීරණයේදී (*In re the Thirteenth Amendment to the Constitution [1987] 2 Sri LR 312)* ව්‍යවස්ථාදායක බලය බෙදා හැරීම පිළිබඳ විවිධ මතයන් ශ්‍රී ලංකාව තුළ 'විවිධත්වය තුල ඒකීයත්වය' සාක්ෂාත් කර ගැනීමට වූ පරස්පර විරෝධී ප්‍රවේශයන් කෙරෙහි බලපා ඇත.

ඉහත ප්‍රකාශය ඉහත සඳහන් නඩුවේ බහුතර මතය සුළුතර මතය සමඟ සංසන්දනය කරමින් හා වෙනස්කොට දක්වමින් සාකච්ඡා කරන්න. ඔබේ පිළිතුර අදාළ විද්වත් මත ඇසුරින් සනාථ කරන්න.

(ලකුණු 100)

3. ජනවාර්ගික - භාෂාමය සුළුතරයන් ව්‍යුහාත්මක වෙනස් කොට සැලකීමෙන් (Systemic Discrimination ) පැන නගින ගැටුම් සඳහා කල්පවත්නා විසඳුමක් බලය බෙදා හැරීමෙන් සැපයිය හැකිය. කෙසේ වෙතත්, බලය බෙදා හැරීමේ වැඩපිළිවෙලෙහි ලේඛනය සකස්කර ඇති අකාරය අනුව, එහි සාර්ථකත්වය රඳා පවතියි.

ඔබ එකඟ වන්නේද? විසිඑක්වන සියවස තුළ එවැනි ගැටුම් සම්බන්ධයෙන් කටයුතු කළ අධිකරණ බල ප්‍රදේශ දෙකක් ඇසුරින් නිදසුන් දක්වමින් ඉහත ප්‍රකාශය විශ්ලේෂණය කරන්න. බලය බෙදා හැරීම සම්බන්ධයෙන් අදාළ වන සංකල්ප සහ විවාදයන් ඇසුරින් ඔබේ පිළිතුර සනාථ කරන්න.

(ලකුණු 100)

4. මධ්‍යම පළාත් සභාව පළාතේ ආබාධිත සහ අවතැන් වූවන් පුනරුත්ථාපනය කිරීම පිළිබඳ ප්‍රඥප්තියක් සම්මත කිරීමට අදහස් කරයි. යෝජිත සමාජ සේවා සහ පුනරුත්ථාපන ප්‍රඥප්තිය පුනරුත්ථාපන ක්‍රියාවලියේ කොටසක් ලෙස සමාජ ආරක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීමට තවදුරටත් උත්සාහ කරයි. අවතැන් වූවන් පුනරුත්ථාපනය කිරීම සමගාමී ලැයිස්තුව යටතේ විෂයක් වන පදනම මත මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයා යෝජිත ප්‍රඥප්තියට සිය අනුමැතිය ලබා දීම ප්‍රතික්ෂේප කරයි. 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචිය සහ අධීක්ෂණ) පනත සහ එහි 1998 අංක 8 දරන සංශෝධන පනත එකම කාරණය සම්බන්ධයෙන් කටයුතු කරන බව ආණ්ඩුකාරවරයා වැඩිදුරටත් අදහස් කරයි. සංශෝධන නොමැතිව පනත් කෙටුම්පත අනුමැතිය සඳහා නැවත ඉදිරිපත් කළ විට, මධ්‍යම පළාත් සභාව විසින් යෝජනා කර ඇති සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය ආබාධිතභාවය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට නොගැලපෙන බව ඉස්මතු කරමින් ආණ්ඩුකාරවරයා නැවත සිය අනුමැතිය ලබා දීම ප්‍රතික්ෂේප කරයි.

යෝජිත සමාජ සේවා සහ පුනරුත්ථාපන ප්‍රඥප්තිය තවදුරටත් ඉදිරියට ගෙන යාම සඳහා මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා ඔබේ උපදෙස් පතයි. ප්‍රධාන අමාත්‍යවරයා ට උපදෙස් දෙන්න. අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු තීන්දු ඇසුරින් ඔබේ පිළිතුර සනාථ කරන්න.

(ලකුණු 100)

5. වංගීස රාජ්‍යය සූරි, යූරි සහ නූරි යන ප්‍රාන්තවලින් සමන්විත ෆෙඩරල් රාජ්‍යයකි. මෙම රාජ්‍යය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමට අදහස් කරයි. ආරම්භයේදීම මධ්‍යම පාර්ලිමේන්තුව යෝජනා කරන්නේ ජාතික ආරක්ෂාව සහ විදේශ කටයුතු විෂයයන් මධ්‍යම රජයට දිය යුතු බවයි. සූරි ප්‍රාන්තය බදු අය කිරීම සහ විදේශීය මූලාශ්‍රවලින් සෘජු ණය ගැනීම සම්බන්ධයෙන් බලතල ඉල්ලා සිටියි. සෙසු ප්‍රාන්ත දෙක සෙනෙට් සභාවට සාමාජිකයින් පනස් දෙනෙකු බැගින් තෝරා ගනිද්දී නූරි ප්‍රාන්තය විසින් තෝරාගනු ලබන්නේ සාමාජිකයින් තිස් දෙනෙකු පමණක් බව නූරි ප්‍රාන්තය පෙන්වා දෙයි. යූරි ප්‍රාන්තය තුළ පිහිටුවා ඇති කලාපයක් වන වන හනාහි ජනතාව, ඔවුන්ගේ සුවිශේෂී ඓතිහාසික, ආගමික සහ භාෂාමය අනන්‍යතාවය හේතුවෙන් සිව්වන ප්‍රාන්තය ලෙස ස්වාධීන පිළිගැනීමක් ඉල්ලා සිටිති. මානව හිමිකම් සංවිධානයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති අයිතිවාසිකම් පනතට අතිරේක මානව හිමිකම් යෝජනා කරයි. කෙසේ වෙතත්, ප්‍රාන්ත ව්‍යවස්ථාදායකයන් මෙම යෝජනාවට විරුද්ධ වන්නේ එම අයිතිවාසිකම්වලට එක් එක් ප්‍රාන්තවල සමාන පිළිගැනීමක් ලබා දිය යුතු නැති බව ඔවුන් විශ්වාස කරන බැවිනි.

ස්වෛරීත්වය, ස්වයං පාලනය සහ හවුල් පාලනය යන මූලධර්මවලට අනුව ප්‍රාන්තවල, හනා කලාපයේ මිනිසුන්ගේ සහ මානව හිමිකම් සංවිධානයේ ඉල්ලීම් සාකච්ඡා කරන්න ඔබගේ පිළිතුර බලය බෙදා හැරීම පිළිබඳ තුලනාත්මක විශ්ලේෂණයකින් සහ නඩු තීන්දු ඇසුරින් සනාථ කල යුතුය.

(ලකුණු 100)

6. 2022 රජයේ ඉඩම් සංවර්ධන පනත් කෙටුම්පත මඟින් රජයේ ඉඩම් සඳහා දීමනා කරුවන් පරම ඉඩම් ප්‍රදානයක් සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි. මාධ්‍ය හමුවකදී, ඌව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා එම පනත් කෙටුම්පත සෑම පළාත් සභාවකටම යොමු නොකිරීම සම්බන්ධයෙන් වූ ආණ්ඩුවේ අසාර්ථකත්වය විවේචනයට ලක් කළේය. දින කිහිපයකට පසු, ජනාධිපතිවරයා ඌව පළාත් සභාවේ පරිපාලනය ව්‍යවස්ථාපිත ප්‍රතිපාදනවලට අනුකූලව ගෙන යා නොහැකි බව ප්‍රකාශ කළ අතර නිල ප්‍රකාශනයක් මගින් මඟින් ඌව පළාතේ පරිපාලනයේ සියලු කටයුතු භාර ගත්තේය. මාස කිහිපයකට පසු, ශ්‍රී ලංකා රජය ආර්ථික අර්බුදයකට මුහුණ දුන් අවස්ථාවේදී ජනාධිපතිවරයා පළාත් සභාවේ සේවය කරන සියලුම සේවකයන්ගේ දීමනා කපා හරින ලෙස ඌව පළාතේ පරිපාලනයට නියෝග කළේය. ඌව පළාත් සභාවේ පරිපාලන කාර්ය මණ්ඩලයට අනුයුක්ත කරන් නමැති නිලධාරියෙක් මෙම උත්සාහයට එරෙහිව වැඩවර්ජනයක් සංවිධානය කළේය. මෙම විරෝධතාවයෙන් අනතුරුව, විනය හේතූන් මත කරන් සේවයෙන් ඉවත් කරන ලෙස ඌව පළාත් ආණ්ඩුකාරවරයා පළාත් රාජ්‍ය සේවා

කොමිෂන් සභාවට නියෝග කළේය. සති දෙකකට පසුව, ආණ්ඩුකාරවරයා ජනාධිපතිවරයාගේ උපදෙස් පරිදි එම පළාත් සභාව විසුරුවා හැරියේය.

ඉහත තත්ත්වය සැලකිල්ලට ගනිමින් ආණ්ඩුකාරවරයා සහ ජනාධිපතිවරයා විසින් ගනුලැබූ ක්‍රියාමාර්ග සහ තීරණවල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය වලංගුභාවය පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදන සහ නඩු තීන්දු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 100)

**************************